# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1998 අංක 15 දරන වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 08 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අප්‍රේල් මස 09 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 6.75 යි.** තැපැල් ගාස්තුව : රු. **2.50 යි.**

**1998 අංක 15 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 08 වන දින]

එල්.ඩී.–ඕ. 59/95.

**1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 15 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනතේ දීර්ඝ නාමයේ යෙදෙන "එහි කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ" යන වචන ඉවත් කොට ඒ වෙනුවට, "එහි කටයුතු කළමනාකරණය කිරීම සඳහා, ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති නිකුත් කිරීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1959 අංක 23 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය එහි ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ වගන්තිය ලෙස බලපැවැත් වෙන්නේ ය:– 3අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"ආයතනයේ පරමාර්ථ.

3අ. ආයතනයේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි වේ :—

(i) පොදුවේ ගණකාධිකරණය පිළිබඳ න්‍යාය සහ පරිචය ද විශේෂයෙන් ම, විගණනය, මූල්‍ය කළමනාකරණය සහ බදු කටයුතු ද ප්‍රවර්ධනය කිරීම ;

(ii) විගණනය, මූල්‍ය කළමනාකරණය සහ බදු කටයුතු වැනි විෂයයන් ඉගෙන ගැනීමට සහ දැනීම වැඩිදියුණු කර ගැනීමට අපේක්ෂා කරන සාමාජිකයන් බඳවා ගැනීම, ඔවුන්ට අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම ;

(iii) ගණකාධිකාරීවරයන්ගේ වෘත්තීය ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සහ වෘත්තීය කටයුතු සහ චර්යාව විෂයයෙහි ලා උසස් ප්‍රමිති තම සාමාජිකයන් විසින් පවත්වා ගෙන යනු ලබන බවට වග බලා ගැනීම ;

2—D 047311—5,900

(iv) ජාතික, පොදු, අධ්‍යාපන හෝ පුණ්‍ය කාර්ය සඳහා පරිත්‍යාග සහ සම්මාදම් දීම ;

(v) විශ්වවිද්‍යාලවලට හෝ වෙනත් අධ්‍යාපනික ආයතනවලට ආධාර මුදල් දීම ;

(vi) ශිෂ්‍යත්ව පිරිනැමීම සහ ආයතනයේ සාමාජිකයන්ගේ අර්ථ සිද්ධිය ප්‍රවර්ධනය කිරීම අරභයා ප්‍රදර්ශන පැවැත්වීම ;

(vii) ආයතනයේ සහ අනෙකුත් වෘත්තීය බල මණ්ඩලවල සාමාජිකයන්ට සහ නියමිත කොන්දේසි සපුරාලන වෙනත් තැනැත්තන්ට ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ වෙනත් ප්‍රදාන පිරිනැමීම අරභයා වූ වැඩ සටහන් සංවිධානය කිරීම, ඒ සඳහා මුදල් යෙදවීම සහ ඒවා පවත්වා ගෙන යාම ;

(viii) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් යම් සමිතියකට ආධාර මුදල් හෝ සම්මාදම් දීම ;

(ix) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) ආයතනයේ අධි සාමාජිකයකු වශයෙන් සභාව විසින් (2) වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් නොලත් සාමාජිකයකු, ආයතනයේ සාමාජිකයකු ලෙස ඇතුළත් කරගනු ලැබීමෙන් ඉක්බිති අවුරුදු පහක සාමාජික කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු, ආයතනයේ අධි සාමාජිකත්වයට උසස් කිරීම සඳහා සභාව විසින් නියම කරනු ලබන අවශ්‍යතා සම්පූර්ණ කොට, නියමිත ගාස්තුව සභාව වෙත ගෙවා තත් කාර්යය සඳහා සභාව වෙත ඉල්ලුම් කළ විට සභාවේ අධි සාමාජිකයකු වශයෙන් සභාව විසින් ලියාපදිංචි කරනු

ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය. එවැනි සාමාජිකයකු ආයතනයේ අධි සාමාජිකයකු ලෙස සභාව විසින් ලියාපදිංචි කරනු ලැබූ විට, තමා ආයතනයේ අධි සාමාජිකයකු බව ඇඟවීම සඳහා තම නම අගට "එෆ්.සී.ඒ" යන අභිධානය එකතු කිරීමේ හිමිකම ඔහුට ලැබෙන්නේ ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) සභාපතිවරයකුගෙන්, උපසභාපතිවරයකුගෙන් සහ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි පත් කරනු ලබන හෝ ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලබන වෙනත් සාමාජිකයන් දහහතර දෙනකුගෙන් සභාව සමන්විත විය යුතු ය.".

(2) ඒ වගන්තියේ—

(අ) (4) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අටදෙනෙක්. විගණකාධිපතිවරයා ආයතනයේ සාමාජිකයකු වේ නම් ඔහු ඔවුන් අතුරෙන් කෙනකු විය යුතු අතර ආයතනයේ කලින් සිටි සභාපතිවරයා එහි තවත් සාමාජිකයකු විය යුතු ය;

(ආ) ආයතනයේ සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් හයදෙනෙක්;

(ඇ) විගණකාධිපතිවරයා ආයතනයේ සාමාජිකයකු නොවන අවස්ථාවක දී හෝ අවසානයට සිටි සභාපතිවරයා ආයතනයේ පත්වීම භාර ගැනීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්.";  සහ

(ආ) එහි (ii) වන ඡේදයේ දැක්වෙන, "මේ උපවගන්තියේ (අ) ඡේදය" යන වචන වෙනුවට, "මේ උපවගන්තියේ (අ) හෝ (ඇ) ඡේද" යන වචන ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් එහි ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බල පැවැත්වෙන්නේ ය:—

"සභාපතිවරයාට සහ උපසභාපතිවරයාට අදාළ විශේෂ විධිවිධාන.

7අ. (1) ධුර කාල එකකට වඩා වැඩි කාලයකට සභාවේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සභාවේ සාමාජිකයෝ නුසුදුස්සෝ වෙති.

(2) සභාවේ යම් සාමාජිකයකු—

(අ) ආයතනයේ අධි සාමාජිකයකු නොවේ නම්; සහ

(ආ) සභාව විසින් පත් කරනු ලැබූ කමිටු අතුරින් යටත් පිරිසෙයින් කමිටු තුනක සේවය කොට නොමැති නම් ; සහ

(ඇ) උපසභාපති ධුරය සඳහා නාම යෝජනා භාර ගැනීම අවසාන වන දිනයට පෙරාතුව ම වූ පස් වර්ෂ කාල පරිච්ඡේදය තුළ දී යටත් පිරිසෙයින් එක් වාරයක් සභාවේ සාමාජිකයකුව නොසිටියේ නම්

එවැනි සාමාජිකයෙක් සභාවේ උපසභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට නුසුදුස්සෙක් වේ.

(3) මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද ඒ නොතකා, සභාවේ ඊළඟ නිල කාල පරිච්ඡේදය ආරම්භ වීමට යටත් පිරිසෙයින් මාස හයකට පෙර පවත්වනු ලබන රැස්වීමක දී, සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් තුනක එයට පක්ෂව ඡන්දය දුන් (නොපැමිණි සාමාජිකයන් ද ඇතුළුව) වැඩි රහස් ඡන්දයෙන් අන් ආකාරයකට

සභාව විසින් සම්මත කර ගනු ලැබුවහොත් මිස, සභාවේ උපසභාපති ධුරය දරන ආයතනයේ සාමාජිකයා සභාවේ ඊළඟ නිල කාල පරිච්ඡේදය සඳහා සභාවේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. සභාව විසින් යට කී පරිදි යෝජනා සම්මත කර ගන්නා ලද අවස්ථාවක දී හෝ සභාවේ උපසභාපති ධුරය දරන ආයතනයේ සාමාජිකයාට සභාවේ ඊළඟ නිල කාල පරිච්ඡේදය සඳහා සභාපති ධුරය භාර ගැනීමට නොහැකි වන නැතහොත් එකී ධුරය භාර ගැනීමට ඔහු අකමැති වන අවස්ථාවක දී, ආයතනයේ සාමාජිකයන් විසින් තමන් අතරෙන් කෙනකු සභාවේ සභාපති ධුරය සඳහා තෝරා පත් කර ගත යුතු ය. එසේ වුව ද, එසේ තෝරා පත් කර ගනු ලබන සාමාජිකයා (2) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල දක්වා ඇති සුදුසුකම් දරන්නා වූ ද සභාවේ සභාපති ධුරය දරන සාමාජිකයා නොවන්නා වූ ද සාමාජිකයකු විය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3අ) සභාවේ අවසරය ලබා නොගෙන, සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීම පැහැර හරින සභාවේ සාමාජිකයකු, එවැනි අවසාන රැස්වීම පැවැත්වූ දින සිට බලපවත්වන සේ තම සාමාජිකත්වය අත්හැර දැමූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඕ) ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති නිකුත් කිරීමට;

(ක) ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ග) චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් මිලට ගැනීමට, බද්දට ගැනීමට, කුලියට ගැනීමට හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීමට සහ එවැනි යම් දේපළක් විකිණීමට, උකස් කිරීමට, බදු දීමට හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමට;

(ජ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි කිසිවක් ඉදි කිරීමට, වෙනස් කිරීමට, නඩත්තු කිරීමට සහ අංගෝපාංග සම්පූර්ණ කිරීමට;

(ච) ආයතනයේ නිලධරයන්ට සහ සේවකයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට පාරිශ්‍රමික, දීමනා, විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනා ගෙවීමට;

(ට) ආයතනයට යම් සේවයක් ඉටු කරන සභාවේ සාමාජිකයන්ට සහ වෙනත් යම් තැනැත්තන්ට ඔවුන්ගේ වියදම් ගෙවීමට; සහ

(ඩ) ආයතනයේ පරමාර්ථ ඉටු කරගෙන යාමට අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීමට.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) (අ) ආයතනයේ යම් සාමාජිකයකු වෘත්තීය විෂමාචාරයක් සම්බන්ධයෙන් වරදකරුවකු වී ඇති බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු, සභාව වෙත කරනු ලැබූ පැමිණිල්ලක් මත හෝ අන්‍යාකාරයකින් හෝ, සභාව වෙත ඇති අවස්ථාවක දී, ඒ සාමාජිකයාට විරුද්ධව බැලූ බැල්මට පෙනෙන වෘත්තීය විෂමාචාරයක් සිදු වී ඇත්දැයි පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විමර්ශන කමිටුවක් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) සාමාජිකයකුට විරුද්ධව බැලූ බැල්මට පෙනෙන වෘත්තීය විෂමාචාරයක් සිදු වී තිබෙන බව, (අ) ඡේදය යටතේ පත් කරන ලද විමර්ශන කමිටුවක් විසින් සභාව වෙත වාර්තා කරනු ලැබූ අවස්ථාවක දී, ඒ සාමාජිකයාගේ චර්යාව පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට විනය කමිටුවක් සභාව විසින් පත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ දැක්වෙන, "සභාව, විසින් එකී බලය පාවිච්චි කිරීම වෙනුවට, සුදුසු යයි සභාව අදහස් කරන කාල පරිච්ඡේදයකට ඒ තැනැත්තාගේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබිය හැකි ය" යන වචන වෙනුවට, "සභාව විසින්, එකී බලය පාවිච්චි කිරීම වෙනුවට, ඒ තැනැත්තාට අවවාද කිරීම හෝ තරවටු කිරීම හෝ සුදුසු යයි සභාව අදහස් කරන කාල පරිච්ඡේදයකට ඒ තැනැත්තාගේ සාමාජිකත්වය අත්හිටුවීම කරනු ලැබිය හැකි ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, "වෙනත් යම් තැනැත්තකු සමග හවුලේ" යන වචන වෙනුවට, "වෙනත් යම් තැනැත්තකු සමග හවුලේ හෝ සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඇ) උපවගන්තියේ "ගිණුම් තැබීමේ ක්‍රමය හෝ" යන වචන වෙනුවට "ගිණුම් තැබීමේ ක්‍රමය හෝ සමාගම් සඳහා වූ බදු ක්‍රමය හෝ වාණිජ කටයුතු හෝ" යන වචන ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (10) වන අනුඡේදයේ "යුතු ය" යන වචනය ඉවත් කොට ඒ වෙනුවට, "යුතු අතර, ඒ පරීක්ෂණයේ විෂය කරුණ වූ චර්යාව සිදු කළ තැනැත්තාට ඒ වාර්තාවේ පිටපතක් යැවීමට සැලැස්විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.